# වාර්ෂික ස්ථාන මාරු - 2025

## උපදෙස් මාලාව - 04

## (පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා නිලධාරීන් තෝරා ගැනීමට අදාළ උපදෙස්)

01. වාර්ෂික ස්ථාන මාරු යටතේ තම පළමු කැමැත්ත ලෙසට ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක් වෙතට ස්ථාන මාරු ලැබීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් විසින් මෙහි දක්වා ඇති උපදෙස් පිළිපැදිය යුතුය.

02. එම නිලධාරීන් විසින් මෙම චක්‍රලේඛයේ ඇමුණුම් අංක 08 හි දක්වා ඇති ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානියා විසින් සහතික කර 2025.02.28 දින හෝ ඊට පෙර දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත **ලියාපදිංචි තැපෑලෙන්** ලැබීමට සැලැස්විය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් මේ සඳහා සලකා බලනු නොලැබේ.

03. ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන වෙතට නිලධාරීන් තෝරා ගැනීමට අදාළ ලකුණු ලබා දීමේ නිර්ණායක මෙහි දක්වා ඇති අතර ඒ අනුව ගණනය කරන ලද ලකුණු 2025.03.07 දින ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියේ (www.cs.sp.gov.lk) පළ කරනු ලැබේ.

04. දකුණු පළාත්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව හැර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙතට නිලධාරීන් තෝරා ගැනීමේදී, එකී දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු ලැබ ඉවත් වන නිලධාරීන් එකී දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කරන අවස්ථාවේදී සිටි ශ්‍රේණියට අදාළ නිලධාරියෙකු තෝරා ගැනීම සිදු කරනු ඇත.

05. දකුණු පළාත්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී පහත පරිදි ශ්‍රේණි අතර සංතුලනය ඇති වන පරිදි නිලධාරීන් පත් කරනු ලැබේ.

| සේවාව | අනුමත නිලධාරීන් ගණන | ශ්‍රේණිය | අදාළ ශ්‍රේණියේ නිලධාරීන් ගණන | | |
|---|---|---|---|---|---|
| | | | ගාල්ල | මාතර | හම්බන්තොට |
| සංවර්ධන නිලධාරී සේවය | 22 | I | 02 | 01 | 01 |
| | | II | 05 | 03 | |
| | | III | 08 | 01 | 01 |
| කළමනාකරණ සේවා නිලධාරී සේවය | 11 | I | 02 | 01 | |
| | | II | 02 | 01 | |
| | | III | 04 | | 01 |
| රියදුරු සේවය | 04 | Special / I | 01 | 01 | |
| | | II | 01 | | |
| | | III | | | 01 |
| කාර්යාල සේවක සේවය | 05 | Special / I | 01 | 01 | |
| | | II | 01 | 01 | |
| | | III | | | 01 |

06. අයදුම්පත් යොමු කිරීමේදී සාවද්‍ය තොරතුරු යොමු කර ඇති බවට තොරතුරු හෙළි වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරනු ලැබේ. එබැවින්, නිවැරදි තොරතුරු පමණක් ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන් කටයුතු කළ යුතු අතර අදාළ සියලුම තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවේ සඳහන් පරිදි නිවැරදි බවට සනාථ කර ගැනීමට පෞද්ගලික ලිපිගොනු විෂය නිලධාරීන් / ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

07. ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන වෙත අයදුම් කරන කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රධාන ලේකම් කාර්යාලය නියම කරන ආකාරයට සිදු කරන ලබන පරිගණක හැකියාව විමසීම් කරන පරීක්ෂණයෙන් සමත් වීම අනිවාර්ය වේ.

## මූලික සුදුසුකම්

01. විනය පරීක්ෂණවලින් වරදකරුවෙකු බවට පත් නොවීම.
02. පෙර අවස්ථාවලදී ඉතා ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය නොකිරීම. (චක්‍රලේඛයේ 3.3 බලන්න.)
03. එකම කාල පරිච්ඡේදයක් තුල නිලධාරියා හා කලත්‍රයා ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය නොකිරිම.
04. පරිගණක හැකියාව විමසන ලබන පරීක්ෂණයෙන් සමත් විම.
05. වර්තමාන ශ්‍රේණියට අදාළ ව කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් නොවීම මත වැටුප් වර්ධක විලම්භනය නොවීම.

## ලකුණු පටිපාටිය

<table>
<tr><th>ලකුණු දීමේ පටිපාටිය (2025.01.31 දිනට)</th><th>ලකුණු</th></tr>
<tr><td>01. ආසන්න වසර 05 ක කාර්යය සාධන ඇගයීම්<br>
• ඉතා හොඳයි - ලකුණු 03<br>
• හොඳයි - ලකුණු 02<br>
• සතුටුදායකයි - ලකුණු 01<br>
• අසතුටුදායකයි - ලකුණු 00</td><td>ලකුණු 15</td></tr>
<tr><td>02. ප්‍රශංසා සහතික<br>
වසර 05 කට පෙර ලබා ගත් ප්‍රශංසා සහතික (එක් සහතිකයකට ලකුණු 03)</td><td>ලකුණු 15</td></tr>
<tr><td>03. ජ්‍යෙෂ්ඨත්වය<br>
I. දැනට සිටින ශ්‍රේණියට අදාළව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීම - ලකුණු 05<br>
II. පහත පරිදි ශ්‍රේණියක සම්පූර්ණ කරන ලද වසරකට ලකුණු 01 බැගින්
<table>
<tr><th>ශ්‍රේණිය</th><th>ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>III</td><td>10</td></tr>
<tr><td>II</td><td>10</td></tr>
<tr><td>I</td><td>05</td></tr>
</table></td><td>ලකුණු 30</td></tr>
<tr><td>04. අධ්‍යාපන සුදුසුකම්<br>
ගිණුම්කරණය, ආර්ථක විද්‍යාව, කළමනාකරණය, බදුකරණය, තක්සේරුකරණය, නීතිය, සංඛ්‍යානය, සමාජ විද්‍යාව, තොරතුරු තාක්ෂණය, සංවිධාන චර්යාව යන විෂයන් / මොඩියුල එකක් හෝ ආවරණය වන පරිදි ලබා ඇති පහත අධ්‍යාපන සුදුසුකම්<br>
• පශ්චාත් උපාධි - 05<br>
• උපාධි - 04<br>
• උසස් ජාතික ඩිප්ලෝමා - 03<br>
• ඩිප්ලෝමා (අවම මාස 12) - 02<br>
(සංවර්ධන නිලධාරින් සඳහා උපාධිය යන ගණයට හිමි ලකුණු ලබා ගැනිම සඳහා වර්තමාන තනතුරට සුදුසුකම් ලැබූ උපාධිය හැර වෙනත් උපාධියක් ලබා තිබිය යුතු අතර එම සියලු උපාධි පිළිබඳව අයදුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.)</td><td>ලකුණු 20</td></tr>
<tr><td>05. පසුගිය වසර 05 තුළ ලබා ගෙන ඇති නිවාඩු ප්‍රමාණය<br>
ආසන්න වසර 05ක කාලය තුළ දී ඉතිරිව ඇති නිවාඩු 10කට ලකුණු 01 බැගින්</td><td>ලකුණු 20</td></tr>
<tr><td>එකතුව</td><td>100</td></tr>
</table>

# ලකුණු දීමේ පටිපාටිය - කාර්යාල සේවක සේවය / පළාත් රියදුරු සේවය

## මූලික සුදුසුකම්

01. විනය පරීක්ෂණවලින් වරදකරුවෙකු බවට පත් නොවීම.
02. පෙර අවස්ථාවලදී ඉතා ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය නොකිරීම. (චක්‍රලේඛයේ 3.3 බලන්න.)
03. එකම කාල පරිච්ඡේදයක් තුල නිලධාරියා හා කලත්‍රයා ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය නොකිරිම.
04. රිය අනතුරු සඳහා වරදකරුවෙකු නොවීම. (රියදුරු සේවයේ නිලධාරීන්)
05. වර්තමාන ශ්‍රේණියට අදාළ ව කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් නොවීම මත වැටුප් වර්ධක විලහම්භය නොවීම.

## ලකුණු පටිපාටිය

<table>
<tr><th>ලකුණු දීමේ පටිපාටිය (2025.01.31 දිනට)</th><th>ලකුණු</th></tr>
<tr><td>01. ආසන්න වසර 05 ක කාර්යය සාධන ඇගයීම්<br>• ඉතා හොඳයි - ලකුණු 03<br>• හොඳයි - ලකුණු 02<br>• සතුටුදායකයි - ලකුණු 01<br>• අසතුටුදායකයි - ලකුණු 00</td><td>ලකුණු<br>15</td></tr>
<tr><td>02. ප්‍රශංසා සහතික<br>වසර 05 කට පෙර ලබා ගත් ප්‍රශංසා සහතික (එක් සහතිකයකට ලකුණු 03)</td><td>ලකුණු<br>15</td></tr>
<tr><td>03. ජ්‍යෙෂ්ඨත්වය<br>I. දැනට සිටින ශ්‍රේණියට අදාළව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීම - ලකුණු 05<br>II. පහත පරිදි ශ්‍රේණියක සම්පූර්ණ කරන ලද වසරකට ලකුණු 01 බැගින්<br><table><tr><th>ශ්‍රේණිය</th><th>ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය</th></tr><tr><td>III</td><td>10</td></tr><tr><td>II</td><td>10</td></tr><tr><td>I</td><td>05</td></tr></table></td><td>ලකුණු<br>30</td></tr>
<tr><td>05. පසුගිය වසර 05 තුළ ලබා ගෙන ඇති නිවාඩු ප්‍රමාණය<br>ආසන්න වසර 05ක කාලය තුළ දී ඉතිරිව ඇති නිවාඩු 10කට ලකුණු 02 බැගින්</td><td>ලකුණු<br>40</td></tr>
<tr><td>එකතුව</td><td>ලකුණු<br>100</td></tr>
</table>